දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය හුදෙක් අර්ථයෙන් එකිනෙකට ප්‍රතිවිරුද්ධ නොවූවද දෙවියන්වහන්සේ සහ මිනිසා අතර ඇති සම්බන්ධතාව පිළිබඳව පදනමක් හැටියට ගත් කල මේ දෙක අතර ඇත්තේ ඉමහත් වෙනසකි. දෙවියන්වහන්සේ යුග, කාල වකවානුවලට සීමා නොවන නමුදු, මනුෂ්‍යයා සමග උන්වහන්සේගේ ක්‍රියාකිරීමේදී පරණ ගිවිසුම් යුගය ව්‍යවස්ථාවෙන්ද අළුත් ගිවිසුම් යුගය අනුග්‍රහයෙන්ද අර්ථවත් වේ.

ඇදහිලිවන්තයා මෙම වෙනස දේව වචනය තුළින් හොඳින් ඒත්තු ගන්නේ නැතිනම් තම කිතුනු ජීවිතය නිරවුල්ව පවත්වාගෙන යා ගත නොහැකිව දෙලොවක් අතර අතරමං වෙයි. මෙම තත්ත්වයෙන් මිදීමට නම් අපි ව්‍යවස්ථාව සහ අනුග්‍රහය පිළිබඳව දේව වචනයානුකූල අධ්‍යනයක යෙදිය යුතුවෙමු.

ISBN 978-955-51101-2-9

# ව්‍යවස්ථාවද? අනුග්‍රහයද?

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ගැන නිරවුල් කතිකාව




නෙවිල් ජයසුන්දර

# ව්‍යවස්ථාවද? අනුග්‍රහයද?

**දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ගැන නිරවුල් කතිකාව**

**ISBN** 978-955-51101-2-9

නෙවිල් ජයසුන්දර

විස්ඩම් පබ්ලිෂර්ස් විසින් මුද්‍රණය කරන ලදී.

අංක 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත

# හැඳින්වීම

දෙවියන්වහන්සේගේ වචනය වන ශුද්ධ බයිබලයේ ඉතා කැපී පෙනෙන වෙනසක් සහිත සිද්ධාන්ත දෙකක් ඇත. එනම්, ව්‍යවස්ථාව සහ අනුග්‍රහයය. **දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව** සහ **දෙවියන්වහන්සේගේ අනුග්‍රහය** හුදෙක් අර්ථයෙන් එකිනෙකට ප්‍රතිවිරුද්ධ නොවූවද දෙවියන්වහන්සේ සහ මිනිසා අතර ඇති සම්බන්ධතාව පිළිබඳව පදනමක් හැටියට ගත් කල මේ දෙක අතර ඇත්තේ ඉමහත් වෙනසකි. ඇත්තෙන්ම මේ එකිනෙකට වෙනස් වූ කරුණු දෙක මගින් යුදෙව් සහ කිතුණු යන යුග දෙක අර්ථවත් කෙරේ.

**"මක්නිසාද ව්‍යවස්ථාව මෝසෙස් කරණකොටගෙන දෙන ලද්දේය. අනුග්‍රහය හා සත්‍යය පැමිණුනේ යේසුස්වහන්සේ කරණකොටගෙන ය" (යොහන් 1:17).** එහෙත් මෝසෙස්ට පෙර කොහෙත්ම ව්‍යවස්ථාවක් නොතිබුණු බවක් හෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පෙර අනුග්‍රහය හා සත්‍යයක් නොතිබුණු බවක් හෝ මෙම පදයෙන් අදහස් නොකෙරේ. යහපත හා නපුර දැන ගැනීමේ ගසෙන් ඵල කෑම ආදම් හට තහනම් කිරීම දෙවියන්වහන්සේගේ නීතියකි(ව්‍යවස්ථාවකි) (උත්පත්ති 2:17). පාපයට වැටුණු මිනිසා සම් ඇඳුමකින් වැසීම දෙවියන්වහන්සේගේ අනුග්‍රහය පිලිබිඹු කරයි (උත්පත්ති 3:21). ව්‍යවස්ථාව දෙවියන්වහන්සේගේ කිසියම් කැමැත්තක් එළිදරව් කිරීමක් හැටියටද, අනුග්‍රහය දෙවියන්වහන්සේගේ යහපත් කම එළිදරව් කිරීමක් හැටියටද සැමදා පැවතුණි. එයට පරණ ගිවිසුම් හෝ අළුත් ගිවිසුම් හෝ කියා කාල වකවානු භේද නැත. එහෙත් සීනයි කන්දේදී මෝසෙස් කරණකොටගෙන දෙනු ලැබුවාවූ නීති සංග්‍රහය දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ලෙස සීනයි කන්දේ සිට කල්වාරි කන්ද දක්වා බලපැවැත්වුණි. ක්‍රිස්තුස්වහන්සේ විසින් තම ජීවිත පූජාව කරණකොටගෙන මිනිසාට හිමිකර දුන් පව්කමාව ලැබීමේ හැකියාව දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ලෙස කල්වාරි කන්දේ සිට ක්‍රිස්තුස්වහන්සේගේ සභාව ඔසවා ගැනීමේ දවස දක්වා බලපවත්වයි.

**ව්‍යවස්ථාව** සහ **අනුග්‍රහය** අතර ඇති වෙනස ශුද්ධ ලියවිල්ලෙහි තියුණු ලෙස ඉස්මතු කර පෙන්වයි. දෙවියන්වහන්සේ යුග, කාල වකවානුවලට

සීමා නොවන නමුදු, මනුෂ්‍යයා සමඟ උන්වහන්සේගේ ක්‍රියාකිරීමේදී පරණ ගිවිසුම් යුගය ව්‍යවස්ථාවෙන්ද අළුත් ගිවිසුම් යුගය අනුග්‍රහයෙන්ද අර්ථවත් වේ. ඇදහිලිවන්තයා මෙම වෙනස දේව වචනය තුළින් හොඳින් ඒත්තු ගන්නේ නැතිනම් තම කිතුනු ජීවිතය නිරවුල්ව පවත්වාගෙන යා ගත නොහැකිව දෙලොවක් අතර අතරමං වෙයි. මෙම තත්ත්වයෙන් මිදීමට නම් අපි ව්‍යවස්ථාව සහ අනුග්‍රහය පිළිබඳව දේව වචනයානුකූල අධ්‍යනයක යෙදිය යුතුවෙමු. ඔබගේ ඇදහිලිවන්ත ජීවිතයේ සාර්ථකත්වය මෙම නිරවුල් අවබෝධය මත රඳා පවතින බව දැන ව්‍යවස්ථාව සහ අනුග්‍රහය පිළිබඳව සත්‍ය

# දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව (නීති සංග්‍රහය)

## ව්‍යවස්ථාවේ ස්වභාවය

දෙවියන්වහන්සේ විසින් මෝසෙස් කරණකොටගෙන ඉශ්‍රායෙල් ජනතාවට ලබා දුන් නීති සංග්‍රහය කුමන අකාර දැයි බයිබල් පද කිහිපයකින් තේරුම් ගැනීමට උත්සාහ කරමු.

### 1. ව්‍යවස්ථාව ශුද්ධය, ධර්මිෂ්ඨය, යහපත්ය, ආත්මිකය.

**"එබැවින් ව්‍යවස්ථාව ශුද්ධ ය, ආඥාවද ශුද්ධ ය, ධර්මිෂ්ඨ ය, යහපත් ය"** (රෝම 7:12).
**"මක්නිසාද ව්‍යවස්ථාව ආත්මික බව අපි දනිමුව"** (රෝම 7:14).

දෙවියන්වහන්සේ වෙතින් පැමිණෙන අණ පනත් වන හෙයින් ඒවා ශුද්ධ ය, ධර්මිෂ්ඨ ය, යහපත් ය සහ ආත්මික ය. එහෙත් ඒ අණ පනත් දෙනු ලැබූ මිනිසා පාපකාරීව, අධර්මිෂ්ඨව, අයහපත්ව සහ මාංසිකව සිටියි. එය දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහයේ අඩුපාඩුවක් හේතුවෙන් වූවක් නොවේ. මිනිසාගේ පාපකාරී ස්වභාවය නිසා සිදු වූවකි.

### 2. ව්‍යවස්ථාව ඇදහිල්ලෙන් නොවේ.

**"ව්‍යවස්ථාව වනාහි ඇදහිල්ලෙන් නොවේ. නමුත් ඒ දේ කරන තැනැත්තේ එයින් ජීවත් වන්නේය"** (ගලාති 3:12).

දෙවියන්වහන්ගේ ව්‍යවස්ථාව අනුගමනය කරන්නාට ඇදහිල්ල එතරම් ප්‍රයෝජනයක් නැත. මන්ද ව්‍යවස්ථාව ඇදහිල්ලෙන් නොවේ. එසේ නම් දෙවියන්වහන්සේ මිනිසාට ව්‍යවස්ථාව දුන්නේ කුමක් අරභයාද? මේ

පැනයට පිළිතුරු දේව වචනයානුකූලව දැන සිටීම අති වැදගත් වේ. ඉහත සඳහන් ලෙස අළුත් ගිවිසුම් යුගයේ ජීවත් වන කිතුනු අදහිලිවතුන් තුල මේ පිළිබඳව ඇති දුර්වාබෝධය ඔවුන්ගේ ආත්මික ජීවිතයට අහිතකර ලෙස බලපායි. ඇත්තෙන්ම ව්‍යවස්ථාවේ නිවැරදි භාවිතය කුමක්ද? අපට එයින් සිදුවන සේවය කුමක්ද?

# ව්‍යවස්ථාවේ නිවැරදි භාවිතය (ව්‍යවස්ථාවට කල හැකි දේ)

## 1. ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය දැන, හඳුනාගත හැකි වේ.

**"එසේ වී නම් කුමක් කියමුද? ව්‍යවස්ථාව පාපයද? එසේ නොවේවා. නමුත් ව්‍යවස්ථාවෙන් දැන නොගත්තා නම් පාපය කුමක්දැයි මා නොදැන සිටිනවා ඇත. මක්නිසාද තණ්හා නොවෙන්නැයි ව්‍යවස්ථාවෙහි කියා නොතිබුණා නම් තණ්හාව කුමක්දැයි මා විසින් නොදැන සිටිනවා ඇත. මම වරක් ව්‍යවස්ථාව නැතුව ජීවත්ව සිටියෙමි. නමුත් ආඥාව ලැබූ කල පාපය පණ ලැබුවේය" (රෝම 7:7,9).**

**"කුමක් හෙයින්ද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨකරනු නොලබන්නේය. මක්නිසාද ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය දැනගැනීම වේ" (රෝම 3:20).**

ඉහත පදවලින් ව්‍යවස්ථාවේ නිවැරදි භාවිතය ගැන එක කරුණක් පැහැදිලි වේ. තණ්හා නොවෙන්නැයි ව්‍යවස්ථාවේ කියා නොතිබුනා නම් තණ්හාව වැරැද්දක් බව අප නොදැන සිටිනු ඇත. එවිට අප තණ්හා වූ වත් කිසි වරදක් නොකල අය ලෙස පෙනෙන්ට තිබුණි. තමා පව් කල බව මිනිසා ඒත්තු ගන්නේ දෙවියන්වහන්සේගේ නීති ව්‍යවස්ථාව හේතුවෙනි. දෙවියන්වහන්සේගේ නීතිය නොතිබුනා නම් ඕනෑම පාපයක්, පාපයක් නොවේ යැයි තර්ක කිරීමට යමෙකුට හැකියාව තිබුණි. ජීවමාන දෙවියන්වහන්සේ වැඩ

සිටින බව විශ්වාස නොකරන කෙනෙක් තමාගේ ජීවිතයේ වැරදි පිළිබඳව නිර්ණය කරන ප්‍රමිතිය වශයෙන් භාවිතා කරන්නේ කුමක්ද? මාගේ සියලු ක්‍රියා ගැන මා විසින් ගණන් දෙන්ට යුතු වූ දෙවියන්වහන්සේ කෙනකු නොමැති නම් ඕනෑම වැරදි වැඩක් කිරීමෙන් අනතුරුව එය නිවැරදි යැයි සිතා ජීවත් වීමේ අයිතිය මට තිබේ. එවිට හරි වැරදි තීරණය කිරීමට අයිතිය ඇති බලවතා කවුද? මට හරි දේ ඔබට වැරදි විය හැකිය. මා හරි යයි සිතන දේ කල විට ඒ ගැන මට දඬුවම් දෙන්නේ ඇයි?

මේ නිසා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවෙන් සිදු කෙරෙන පලමු වැනි දේ නම් පාපය කුමක් දැයි හඳුන්වා දීමයි. දෙවිකෙනෙක් නැතැයි සිතන්නා උන්වහන්සේගේ ව්‍යවස්ථාවත් විශ්වාස නොකරයි. එසේ නම් හරි වැරදි පිළිබඳව නිර්ණය කිරීමට ඔහුට ප්‍රමිතියක් නැත. මේ නිසා "**අඥානයා දෙවිකෙනකු නැතැයි තමාගේ සිත තුළ කියා ගත්තේ යයි" ගීතාවලිය** 14:1 හි සඳහන් වේ.

## 2. ව්‍යවස්ථාව කරණකොටගෙන සියලු කටවල් පියවනු ලැබේ.

**"ඉදින් ව්‍යවස්ථාවෙහි කියන සියල්ලම ව්‍යවස්ථාව යටතෙහි සිටින්නන්ට කියන ලද බව අපි දනිමු. එසේ වන්නේ සියල්ලන්ගේ කටවල් පියවනු ලබන පිණිසත් මුළු ලෝකයා දෙවියන්වහන්සේගේ විනිශ්චයට යටත්කරනු ලබන පිණිසත්ය" (රෝම 3:19).**

දෙවියන්වහන්සේ මිනිසාට දුන් නීති සංග්‍රහය මගින් සියලු මිනිසුන් වැරදි කරුවන් බව ඔප්පු වන නිසා එමගින් දෙවියන්වහන්සේගේ විනිශ්චයේදී මිනිසුන් හට කට උත්තර නැති වේ. තමා කළ පාපය, පාපයක් නොවේ යැයි තර්ක කිරීමට කිසිවකුට නොහැකි වනු ඇත. මෙහිදී ප්‍රශ්ණය වනුයේ නීතිය දැන සිටියාද නැද්ද යන්න නොව නීතිය නොපැවැත්තුවේ මන්ද යන්න යි. උදහරණයක් ලෙස අධික වේගයකින් වාහනය ධාවනය කිරීමේ වරද හේතුවෙන් උසාවියට ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයෙක් ගැන සිතන්න. තමා එසේ කලේ එවන් නීතියක් දැන නොසිටි නිසා යයි පවසා ඔහු දඬුවමින් ගැලවී යන්නේ යයි ඔබ සිතන්නේද? උපරිම සුදුසු වේගය නීති පොතෙහි

ලියා තිබෙන බැවින් එම පුද්ගලයාගේ නිදහසට කරුණු කීම නිශ්ප්‍රයෝජන වේ.

## 3. ව්‍යවස්ථාව සියලු මිනිසුන් ශාපයට යටත් කරයි.

**"යම් පමණ දෙනෙක් ව්‍යවස්ථාවේ ක්‍රියාවල පිහිටෙන්නෝද, එපමණ දෙනා ශාපයකට යටත්ව සිටිති. මක්නිසාද ව්‍යවස්ථා පොතෙහි ලියා තිබෙන සියලු දේවල් කරන පිණිස එහි නොපවතින සියල්ලෝ ශාපලද්දෝ බවට ලියා තිබේ" (ගලාති 3:10).**

ඉතා විශ්වාසවන්ත ලෙස ව්‍යවස්ථාවට කීකරුවන පුද්ගලයා පවා ඉතා කුඩා අණක් සම්බන්ධව අසාර්ථක වුවහොත් ඔහු මුළු ව්‍යවස්ථාව පිළිබඳව වරද කරුවෙක් වන බව යාකොබ් 2:10 හි සඳහන්ව තිබේ. **"මක්නිසාද යමෙක් මුළු ව්‍යවස්ථාව රක්ෂාකොට, එක අණක් කඩකළේ නම්, සියල්ල ගැන වරදකාරයෙක්වී සිටී"** මේ හේතුවෙන් ව්‍යවස්ථාව කරණකොටගෙන විමුක්තියක් ලැබීමට කිසිදුක හැකිවන්නේ නැත.

## 4. ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය ඉතා පාපිෂ්ඨව පෙනේ

**"මෙසේ වුනේ යහපත්වූ එක** (ව්‍යවස්ථාව) **කරණකොටගෙන මට මරණය ඉපදවීමෙන් පාපය, පාපය ලෙස පෙනෙන පිණිසත් ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය ඉතා පාපිෂ්ඨව පෙනෙන පිණිසත්ය" (රෝම 7:13).**

තමා කළ පාපයේ බරපතලකම අවම කොට දැක්වීමට උත්සාහ කිරීම මිනිසාගේ සමාන්‍ය සිරිතයි. එහෙත් දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය නිසා මිනිසාට එසේ කරන්නට නොහැකි වේ. නීති සංග්‍රහයේ ලියා ඇති දේ කරණකොටගෙන පාපය ඉතා පාපිෂ්ඨ බව සහතික කොට කියා දෙයි.

## 5. ව්‍යවස්ථාව "මරණයාගේ සේවය" ලෙස නම් කොට තිබේ.

**"ඉතින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට මෝසෙස්ගේ මුහුණේ තිබුනු නැතිවී යන්නාවු**

**තේජස නිසා ඔහුගේ මුහුණ දෙස ඇස් හෙළා සිටින්නට බැරි ලෙස, ගල්වල ලියා කොටන ලද මරණයාගේ සේවය තේජසින් යුක්තව පැමිණියේ නම් ...** " (2 කොරින්ති 3:7).

දෙවියන්වහන්සේ විසින් ලබා දුන් නීති සංග්‍රහය මරණයාගේ සේවයක් ලෙස නම් කොට ඇත්තේ එමඟින් මිනිසා මරණයට සුදුස්සකු කරනු ලබන නිසා ය.

## 6. ව්‍යවස්ථාව "වරදට පත්කරනු ලබන සේවය" ලෙස නම් කර තිබේ.

**"වරදට පත් කිරීමේ සේවය තේජස නම්, ධර්මිෂ්ඨකමේ සේවයේ තේජස ඊට වඩා බොහෝ සෙයින් වැඩිව තිබේ" (2 කොරින්ති 3:9).**

මෙහිදී ත් ඉස්මතු වන්නේ ඉහතින් දැක්වූ අදහසම ය. වැරදි මොනවාදැයි ව්‍යවස්ථාවේ ලියා තිබෙන නිසා වරද කළ අප සැබවින්ම වරදකරුවන් බවට ඔප්පු වේ.

## 7. ව්‍යවස්ථාව ආත්මික මරණය ගෙන එයි

**"මම වරක් ව්‍යවස්ථාව නැතුව ජීවත්ව සිටියෙමි. නමුත් ආඥාව පැමිණි කල පාපය පණ ලැබුවේය. මම ද මැරුණෙමි" (රෝම 7:9).**

ව්‍යවස්ථාව මා පව්කරුවකු බව ඔප්පු කරන නිසා මා හට තවදුරටත් නිර්භීත ලෙස දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයක් ගෙන යා නොහැකිය. මේ හේතුවෙන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කරණකොටගෙන මනුෂ්‍යයාව දේව සබඳතාවයට පත්කරනු වෙනුවට දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන්

# ව්‍යවස්ථාවට කළ නොහැකි දේ

දෙවියන්වහන්සේ දුන් ව්‍යවස්ථාව හෙවත් නීති සංග්‍රහය අතිශයින් ශුද්ධය, ධර්මිෂ්ඨය. එහෙත් එයට අප තුළ ඉටු කළ නොහැකි දේ කුමක්දැයි ශුද්ධ බයිබලය පෙන්වා දෙයි.

## 1. ව්‍යවස්ථාව අප ධර්මිෂ්ඨ නොකරයි

**"කුමක් හෙයින්ද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය" (රෝම 3:20).**
**"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන මිස ව්‍යවස්ථාවේ ක්‍රියා කරණකොටගෙන මනුෂ්‍යයෙක් ධර්මිෂ්ඨ කරනු නොලබන බව දැන..... ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගනිමුව. මක්නිසාද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කවර මනුෂ්‍යයෙක්වත් ධර්මිෂ්ඨ කරනු නොලබයි" (ගලාති 2:16).**

සත්‍ය කරුණු මෙසේ වුවත් කිතුනු සම්ප්‍රදය තුල ජීවත් වන බොහෝ දෙනා සිතා සිටින්නේ **දස පණත** පැවැත්වීමෙන් ධර්මිෂ්ඨයකු වී ස්වර්ගයට යා හැකි බවයි. එය සහමුලින්ම වැරදි අදහසකි. අප ස්වර්ගයට යැම පදනම් වී ඇත්තේ ව්‍යවස්ථාව මත නොව ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ මරණය සහ මළවුන්ගෙන් නැගිටීම මතය.

**"දෙවියන්වහන්සේගේ කරුණාව නිෂ්ඵල නොකරමු. මක්නිසාද ධර්මිෂ්ඨකම ව්‍යවස්ථාව කරණකොටගෙන වේ නම් ක්‍රිස්තුස්වහන්සේ නිකරුණේ මළ සේක" (ගලාති 2:21)**
**"ඉතින් ව්‍යවස්ථාව කරණකොටගෙන කිසිවෙක් දෙවියන්වහන්සේ ඉදිරිපිට ධර්මිෂ්ඨ කරනු නොලබන බව පැහැදිලිය. මක්නිසාද ධර්මිෂ්ඨයා ඇදහිල්ල කරණකොටගෙන ජීවත්වන්නේය" (ගලාති 3:11).**

දස පණත පැවැත්වීමෙන්වත්, දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය ආරක්ෂා කිරීමෙන්වත්, වෙනත් ශීලයක් රක්ෂා කිරීමෙන්වත් ස්වර්ගයට පිවිසීමට බලාපොරොත්තු වීම අඥාණ කමක් බව අපි දැන ගත යුතු වෙමු. **ගලාති** 2:21 යලි කියවා බලන්න. ක්‍රිස්තුස්වහන්සේ මරණයට පත්වූයේ ව්‍යවස්ථාව

කැඩීම යන වරදට අප ලැබිය යුතු දඬුවම ගෙවා දැමීම පිණිසය. නීතිය පවත්වා ස්වර්ගයට පිවිසීමට යමකුට හැකි නම් ක්‍රිස්තුස්වහන්සේ මරණයට පත් වීමේ අවශ්‍යතාවයක් තිබුනේ නැත. මේ නිසා යම් යම් නීති සහ ශීල රැකීමේ අගම් ක්‍රමය ස්වර්ගයට අප ගෙන යන මාර්ගය නොවේ. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය ගැන විශ්වාස කිරීමෙන් පමණක් අපට ස්වර්ගයේ දොරටුව විවර වේ.

## 2. ව්‍යවස්ථාව කිසි දෙයක් සම්පූර්ණ නො කරයි

**"මෙසේ ව්‍යවස්ථාව කරණකොටගෙන <u>කිසිවක් සම්පූර්ණ නොවූ බැවින්,</u> පළමු තිබුණු ආඥාවේ දුර්වලකම හා නිෂ්ප්‍රයෝජනකම නිසා ඒක අවලංගු කිරීම ද, වඩා යහපත් බලාපොරොත්තුවක් පැමිණවීමද සිද්ධ වේ" (හෙබ්‍රෙව් 7:18).**

ව්‍යවස්ථාව මගින් අප ජීවිතවල කිසි දෙයක් සම්පූර්ණ නොවේ. ඒ නිසා එය දැන් අවලංගු කර ඒ වෙනුවට වඩා යහපත් බලාපොරොත්තුවක් ඉදිරිපත් කොට තිබේ. කුමක්ද මේ බලාපොරොත්තුව? ඒ නම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය.

## 3. ව්‍යවස්ථාව මගින් කිසිවෙකු නිර්දෝෂ කරනු ෆ නාලබයි.

**"අදහාගන්නාවූ සියල්ලෝ උන්වහන්සේ (යේසුස්වහන්සේ) කරණකොටගෙන සියලු දේවල් පිළිබඳව නිර්දෝෂ කරනු ලබති. එසේ නුඹලාට මෝසෙස්ගේ <u>ව්‍යවස්ථාව කරණකොටගෙන නිර්දෝෂ කරනු ලබන්ට නුපුළුවන්විය"</u> (ක්‍රියා 13:39).**

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව ශුද්ධ නමුත් එමගින් පව්කාර වූ ඔබ හා මා නිර්දෝෂ කරනු නොලබයි. ඇත්තෙන්ම එයින් සිදුකරන්නේ ඊට

ප්‍රතිවිරුද්ධ දේය. එනම් අප වරදට පත් කිරීමයි.

# ව්‍යවස්ථාව සහ ඇදහිලිවන්තයා අතර ඇති සම්බන්ධතාවය

දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය මගින් අපගේ ජීවිතවල කළ හැකි දේ සහ කළ නොහැකි දේ පිළිබඳව ඉහතදී අපි සැකෙවින් සලකා බැලුවෙමු. එසේ නම් ව්‍යවස්ථාව හා අප අතරෙහි ඇති වර්තමාන සම්බන්ධතාවය කුමන ආකාරදැ යි ඔබ සිතන්නේද?

## 1. ඇදහිලිවන්තයා ව්‍යවස්ථාව යටතෙහි නොවේ.

**"කුමක්හෙයින්ද, නුඹලා <u>ව්‍යවස්ථාව යටතෙහි නොව</u> අනුග්‍රහය යටතෙහි සිටින බැවින්, පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය" (රෝම 6:14).**

බොහෝ කිතුනුවන් නොදැන සිටින නමුදු, දැන සිටිය යුතුම වූ සත්‍යතාවයක් මෙම දේව වචන කොටස මගින් අපට උගන්වයි. ඇදහිලිවන්තයා ජීවත් විය යුත්තේ දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය හෙවත් ව්‍යවස්ථාව යටතෙහි නොවේ. එහි බලපෑමෙන් ඔහු නිදහස් කරනු ලැබ සිටී. නීති රීති යටතෙහි ජීවත්වන විවිධ ආගමික සැදැහැවතුන් ලෙව පුරාම සිටිති. එහෙත් ඔව්හු එම නීති රීති වල දාසයන් පමණකි.

## 2. ඇදහිලිවන්තයා ව්‍යවස්ථාවෙන් නිදහස් කරනු ලැබ සිටියි.

**"නමුත් අපි යමකට බැඳී සිටියෙමුද, ඊට නැසී, <u>ව්‍යවස්ථාවෙන් නිදහස්කරන ලදුව,</u> පදර්ථයේ පැරණි ආකාරයෙන් නොව ආත්මයේ අළුත් ආකාරයෙන් සේවය කරමු" (රෝම 7:6).**

මෙම අපූරු තත්වය ගැන මදක් සිතා බලන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන පුද්ගලයා ව්‍යවස්ථාව යටතෙහි නොව ව්‍යවස්ථාවෙන් නිදහස්කරනු ලැබූ කෙනෙක්ය. මෙය අනර්ඝවූත්, පුදුමවූ

ත්, අළුත් ගිවිසුම් ඇදහිල්ලට පමණක් ආවේනිකවූ සත්‍යතාවයකි. මෙම සත්‍යතාවය අපට නුපුරුදු සත්‍යතාවයකි. ඒ ගැන පැහැදිලි කිරීමේදී පාවුල් තුමා මෙසේ ප්‍රශ්ණ කරයි. **"එසේවී නම් කිමෙක්ද? අපි ව්‍යවස්ථාව යටතෙහි නොව කරුණාව යටතෙහි සිටින නිසා (කැමති ලෙස) පව්කරමුද?" (රෝම 6:15).** කුමක්ද ඔබ එයට දෙන පිළිතුර? අප දිය යුත්තේ පාවුල් තුමා දෙන පිළිතුරම නොවේද? **"එසේ නොවේවා!" (රෝම 6:10).** අප තුල වසන ශුද්ධාත්මයාණන්වහන්සේ පව්කාර ජීවිතයක් ගෙන යාමට අපට ඉඩ නොදෙන සේක.

## 3. ඇදහිලිවන්තයා ව්‍යවස්ථාවට මළ කෙනෙකි.

**"ඇරත් මම දෙවියන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිස ව්‍යවස්ථාව කරණකොටගෙන ව්‍යවස්ථාවට මැරුණෙමි"(ගලාති 2:19).**

ව්‍යවස්ථාවට මැරී සිටී යයි කිමෙන් ව්‍යවස්ථාව සමග අපට කිසිම සම්බන්ධතාවයක් නොමැති බව මනාව ඔප්පු වේ. අප ජනවහරේ ඇති "අදින් පස්සේ මම මැරුණයි කියලා හිතා ගන්න" යන යෙදුමෙහි අර්ථය අපි දනිමු.

එයින් අදහස් වනුයේ ඒ පුද්ගලයා සමඟ තමාගේ කිසිදු සම්බන්ධතාවයක් නැති බවයි. ව්‍යවස්ථාව හා අප අතර පවතින්නේද එවැනි තත්වයකි.

# ඇදහිලිවන්ත ජීවිත රීතිය

කරුණු මෙසේ නම් ක්‍රිස්තුස්වහන්සේව අදහා ගත් පුද්ගලයකුගේ ජීවිතය පාලනය වන ප්‍රතිපත්ති කවරේද? පහත සඳහන් දේව වචන කොටස් තුළින් එය පැහැදිලි කරගත හැක.

**"උන්වහන්සේ තුළ පවතිමියි කියන තැනැත්තා විසින් උන්වහන්සේ හැසුරුණාක් මෙන් හැසිරිය යුතුයි"
(1 යොහන් 2:6).**

**'අප ප්‍රේමය දැනගන සිටින්නේ ඒ තැනැන්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයින් ය. අප විසින් සහෝදරයන් උදෙසා අපේ ජීවිත දෙන්ට යුතු ය" (1 යොහන් 3:16).**

**"ප්‍රේමවන්තයෙනි, නුඹලා ආගන්තුකයන්ද විදේශින්ද මෙන් ආත්මයට විරුද්ධ යුද්ධ කරන මාංසික තෘෂ්ණාවලින් වැලකී සිටින ලෙස නුඹලාගෙන් ඉල්ලමි" (1 පේතෘස් 2:11).**

**"එබැවින් නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස සියලු ආකාර යටහත් කමින්ද මොලොක් ගුණයෙන්ද ඉවසිලිවන්තකමෙන්ද හැසිර...." (එපීස 4:1,2).**

**"එබැවින් නුඹලා ප්‍රිය දරුවන් මෙන් දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා. ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේමකොට මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක්ද යාගයක්ද කොට අප වෙනුවට තමන්ම පවා දුන්නාක්මෙන් නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා" (එපීස 5:1,2).**

**"මක්නිසාද වරක් නුඹලා අන්ධකාරව සිටිය නමුත් දැන් ස්වාමීන්වහන්සේ තුල ආලෝකයව සිටින්නහුය. ආලෝකයේ දරුවන් මෙන් හැසිරියල්ලා" (එපීස 5:8).**

කලක් අපි මිථ්‍යා මත සහ මිථ්‍යා ඇදහිලි ක්‍රම තුල ජීවත්වූවෙමු. පාපයද සුලබව අප ජීවිතවල තිබුනි. ඒ අප ජීවත් වූ අන්ධකාරයයි. අසවල් දේ හොඳ නැත, අසවල් දවස සුභ නැත, අසවල් පාට නැකතට අනුකූල නැත, සහ අසවල් වේලාව සුභ නැත යනාදී වශයෙන් වූ මිනිසුන්ගේ නීති රීති, මති මතාන්තර වලට යටත් නොවී ආලෝකයේ දරුවන් මෙන් ජීවත් වීම අද අපට ඇති කැඳවීමයි. උපතකදී, විවාහයකදී, හෝ මරණයකදී මිනිසුන් අනුගමනය කරන මිනිසුන්ගේ බොරු පණ්ඩිතකම්වලට අනුකූලවූ, නීති රීති සහ සිරිත් විරිත් අනුගමනය කිරීම ඇදහිලිවන්ත අපට සුදුසු නැත.

**"මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලා එකිනෙකාට ප්‍රේමකරපල්ලා යනුය" (යොහන් 15:12).**

**"ඒ දවස්වලට පසුව මා විසින් ඔවුන් සමඟ කරන ගිවිසුම නම්, මාගේ ව්‍යවස්ථාව ඔවුන්ගේ සිත්වල තබා ඒවා ඔවුන්ගේ සිහියේ ලියන්නෙමියි ස්වාමීන්වහන්සේ කියනසේක"(හෙබ්‍රෙව් 10:16).**

මෙය පිළිබඳව ගැලපෙන උදාහරණයක් මෙසේය. යම් රටක නීති පද්ධතියට අනුව දෙමව්පියන් තම දරුවන් රැකබලා ගතයුතු බවට නියම කොට තිබේ. සිතා මතා තම දරුවන්ගේ ශුභසිද්ධිය නොසොයා සිටීම දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි නීතියක් තිබේ යැයි මව්වරුන් නොදැන සිටින නමුත් සෑම මවක්ම තම දරුවාට ආදරේ කරයි. දරුවා රැකබලා ගනී. එවැනි නීතියක් තිබෙන බව නොදන්නා නමුදු එම නීතිය ඔවුන්ගේ සිත්වල ලියැවී තිබෙනවා වැනිය.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින ඇදහිලිවන්තයාගේ සම්බන්ධතාවය මේ ආකාරයි. අද අපි ව්‍යවස්ථාවෙන් නිදහස්ව සිටින්නේ දෙවි සමිඳුන්ගේ කරුණාව යටතට පැමිණි නිසායි. එය

**දෙවියන්වහන්සේගේ අනුග්‍රහය** ලෙස දේව වචනයෙහි සඳහන් කොට තිබේ. දැන් අපි එම දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නමැති සම්පත පිළිබඳව ඉගෙන ගන්නට උත්සාහ කරමු.

# දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යනු කුමක්ද?

**"මක්නිසාද ව්‍යවස්ථාව මෝසෙස් කරණකොටගෙන දෙන ලද්දේය. අනුග්‍රහය හා සත්‍යය පැමිණුනේ යේසුස්වහන්සේ කරණකොටගෙන ය" (යොහන් 1:17).**

**ව්‍යවස්ථාව** සහ **අනුග්‍රහය** අතර ඇති වෙනස පිළිබඳව මෙම දේව වචන පදය යම් ඉඟියක් දෙයි. ව්‍යවස්ථාව පැමිණුනේ මොසෙස් කරණකොටගෙනය. එහෙත් දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පැමිණුනු බව ප්‍රකාශ කිරීමෙන් කාල වකවානු දෙකකදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමඟ ස්ථාපිත කල සම්බන්ධතාවයෙහි ඇති වූ වෙනස පෙන්නුම් කෙරේ. පරණ ගිවිසුම යනුවෙන් අප හඳුන්වන මොසෙස්ගේ මැදහත්කාරකම ඇතුව දෙවියන්වහන්සේ මිනිසා සමඟ කළ ගිවිසුම කරණකොටගෙන දෙවියන්වහන්සේගේ නීති සංග්‍රහය නොහොත් ව්‍යවස්ථාව රජකම් කරන්නට පටගත්තේය. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මැදහත්කාරකමින් යුතුව දෙවියන්වහන්සේ මිනිසා සමඟ කළ ගිවිසුමෙන් පසු දෙවියන්වහන්සේගේ අනුග්‍රහය රජකම් කරන්නට පටන් ගති. එම ගිවිසුම අළුත් ගිවිසුම ලෙස හැඳින්වේ. පරණ ගිවිසුම මොසෙස් කරණකොටගෙන සීනයි කන්දේ දී ස්ථාපිත කරන ලදී. එහෙත් අළුත් ගිවිසුම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන කල්වාරි කන්දේ දී ආරම්භ විණි. එකක් ව්‍යවස්ථාව රජකම්ට පත්කළ අතර අනෙක කරුණා අනුග්‍රහය රජකමට පත් කළේය. අපගේ ඇදහිලිවන්ත ජීවිතයේ වැඩි වර්ධනය සඳහා මෙම වෙනස නිසි ලෙස තේරුම් ගත යුතු වෙමු. එහෙත්, අවාසනාවන්ත ලෙස, මෙම වෙනස හරිහැටි නොදකින කිතුනුවා ව්‍යවස්ථාව සහ අනුග්‍රහය මිශ්‍ර කර තේරුම් ගැනීම හා ජීවිතයට අදාලකර ගැනීම තුලින් වියවුල් තත්වයකට පත්ව සිටී. මේ හේතුවෙන් කිතුනුවා දෙලෙවක් අතර ජීවත් වන්නාක් මෙන් පැරණි හා අළුත් ගිවිසුම් ඉගැන්වීම අතර මැද අතරමං වී සිටී.

ශුද්ධ ලියැවිල්ලෙහි ඉගැන්වීම් තුළ පරණ ගිවිසුම හා අළුත් ගිවිසුම මිශ්‍ර කිරීමක් හෝ ව්‍යවස්ථාව හා අනුග්‍රහය මිශ්‍රකිරීමක් සිදුකොට නැත. ව්‍යවස්ථාවට සැමවිටම තිබුනේ අනුග්‍රහයට වඩා වෙනස් වූ කාර්යභාරයකි.

- ව්‍යවස්ථාව නම් දෙවියන්වහන්සේ යම් යම් දේ තහනම් කිරීමත් සහ බලකිරීමත් ය. එහෙත් අනුග්‍රහය නම් දෙවියන්වහන්සේ යම් යම් දේ අපට ප්‍රදානය කිරීමත් සහ ආයාචනය කිරීමත්ය.
- ව්‍යවස්ථාව වරදට පත් කිරීමේ සේවයකි. එහෙත් දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය යනු කමාව දීමේ සේවයකි.
- ව්‍යවස්ථාව ශාපයක් ගෙන එයි. එහෙත් කරුණා අනුග්‍රහය එම ශාපයෙන් අප මුදයි.
- ව්‍යවස්ථාව අපේ මරණය සිදුකරයි. කරුණා අනුග්‍රහය අපව ජීවත් කරවයි.
- ව්‍යවස්ථාව සිදුකරන්නේ එය ඉදිරිපිට මිනිසාගේ කට වැසීමයි. එහෙත් කරුණා අනුග්‍රහය දෙවියන්වහන්සේව ප්‍රසංශා කරන පිණිස මිනිසාගේ මුව විවර කරයි.
- ව්‍යවස්ථාව දෙවියන්වහන්සේ හා මිනිසා අතර ඇති දුරස්ථ භාවය වැඩි කරයි. එහෙත් කරුණා අනුග්‍රහය මිනිසා දෙවියන්වහන්සේගේ අභිමුඛයට පමුණුවයි.
- ව්‍යවස්ථාව පවසනුයේ **"ඇසකට ඇසක්ය, දතකට දතක්ය"** කියා ය. එහෙත් අනුග්‍රහය **"නුඹේ එක් කම්මුලකට ගසන්නාට අනිකත් හරවාපන්නැ"** යි පවසයි.
- නීති පිළිපැද ජීවත්වන්නැයි ව්‍යවස්ථාව පවසයි. එහෙත් කරුණා අනුග්‍රහය පවසන්නේ විශ්වාස කර ජීවත්වෙන්න කියායි.
- ව්‍යවස්ථාවට මිශනාරිවරුන් නැත. එහෙත් කරුණා අනුග්‍රහය සියලු ජාතීන්ට දේශනා කළ යුතුව ඇත.
- ව්‍යවස්ථාව මඟින් ඉතාම හොඳ මිනිසාත් වරදට පත්කරයි. එහෙත් කරුණා අනුග්‍රහයෙන් ඉතා නරකම මිනිසාත් ධර්මිෂ්ඨකොට ගණන් ගනී.
- ව්‍යවස්ථාව කාමමිථ්‍යාචාරිනියට ගල් ගසයි. එහෙත් අනුග්‍රහය පවසන්නේ **"මමද නුඹ වරදට පත් නොකරමි. ගොස් තවත් පව් නොකරන්න"** කියා ය.
- ව්‍යවස්ථාව යටතෙහි එඬේරාගේ පාප වෙනුවෙන් බැටළුවා මරණයට පත් කරනු ලැබේ. එහෙත් අපූරු දෙය නම්! අනුග්‍රහය යටතෙහි බැටළුවන්ගේ පාප වෙනුවෙන් එඬේරා මරණයට පත් වෙයි.

ඉහත අකාරයට ශුද්ධ ලියවිල්ලෙහි සෑම තැනකම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය අතර ඇති වෙනස පැහැදිළි කර තිබේ. වර්තමානයේ මේ දෙක මිශ්‍ර කොට ඉගැන්වීම තුලින්

දෙකම නරක් වී තිබේ. ව්‍යවස්ථාවේ සැරභාවය හා අනුග්‍රහයේ සෞම්‍යභාවය යන දෙකම හීන කර දැමීමට වර්තමාන කිතුනු ඉගැන්වීම් සමත්වී තිබේ.

කෙසේ වෙතත්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යන දෙකම මිනිසා මෙලොව මවනු ලැබූ දවසේ පටන් ක්‍රියාත්මක වූ බව අප දැනගත යුතුය. පරණ ගිවිසුම් වකවානුව තුලදී ද දෙවියන්වහන්සේ විසින් මිනිසා පිළිගනු ලැබුවේ අනුග්‍රහය පදනම් කරගෙනය. එලෙසම වර්තමාන අළුත් ගිවිසුම් යුගයේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය පිළි නොගන්නා අය කෙරෙහි ව්‍යවස්ථාව බලපවත්වයි. අවසානයේදී එම ව්‍යවස්ථාව කරණකොටගෙන මිනිසා විනිශ්චය කරනු ලබයි. එහෙත් **"ව්‍යවස්ථාව මෝසෙස් කරණකොටගෙන දෙනලද්දේය. අනුග්‍රහයද සත්‍යයද පැමිණුනේ යේසුස්වහන්සේ කරණකොටගෙනය"** යන වදන්වලින් අළුත් ගිවිසුම් යුගයේ ප්‍රමුඛස්ථානයෙහි වැජඹෙන්නේ අනුග්‍රහය බව සිහිකරනු ලබයි. වෙනත් වචනවලින් පවසතොත් වර්තමාන යුගයේ රජකම් කරනුයේ අනුග්‍රහයයි.

අපි දැන් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තව දුරටත් තේරුම් ගන්නට බලමු. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මනාව විස්තර කැරෙන දේව වචන පද කිහිපයක් මෙසේය.

**"නමුත් අපගේ ගැලවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේගේ ගුණවන්තකම ද මනුෂ්‍යයන් කෙරෙහි ඇති ප්‍රේමය ද ප්‍රකාශවූ කල, අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත් කිරීමෙන්ද උන්වහන්සේ අප ගැලවුසේක" (තීතස් 3:4-5).**

**"එසේ කළේ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල අප කෙරෙහි ඇත්තාවූ කරුණාවන්තකම නිසා තමන්වහන්සේගේ අනුග්‍රහයේ ඉතා මහත් සම්පත, පැමිණෙන්නාවූ කාලවලදී පෙන්වන පිණිසය" (එපීස 2:7).**

**"නමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විදීමෙන්ය" (රෝම 5:8)**

ඉහත පද අනුව දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යනු දෙවියන්වහන්සේගේ ගුණවන්තකමද, ප්‍රේමයද අප කෙරෙහි ඇත්තාවූ

කරුණාවන්තකමද වේ. තවද අප පව්කාරයන්ව සිටීයදීම යයි කීමෙන් අපගේ සුදුසුකමක් පදනම් කර නොගෙන අපේ යහපත උදෙසා දෙවියන්වහන්සේ ක්‍රියා කිරීම අදහස් කෙරේ. අනුග්‍රහය නම් අප ලැබීමට නුසුදුසු දේ දෙවියන්වහන්සේ නොමිලයේ අපට ප්‍රදානය කිරීමයි. පව්කමාව, සදාකාල ජීවනය, ගැලවීම, දේව දරුකම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩසිටීම හා ස්වර්ගය වැනි දෑ අප ලබන්නට අයිතියක් නැති දෑය. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඒ දෑ දෙවියන්වහන්සේ විසින් අපට නොමිලයේ ප්‍රදානය කරන සේක.

# දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ ප්‍රයෝජනය

## 1. අපි අනුග්‍රහය කරණකොටගෙන ගැළවීම ලබා සිටිමු.

**"මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැලවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්නා පිණිස එය ක්‍රියාවලින් නොවේ" (එපීස 2:8,9).**

දැන් අප නිරයෙන් ගැලවී සිටින්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසාය. තමාගේම දැහැමි ජීවිතය නිසා නිරයෙන් ගැලවීමට කිසිවකුට නුපුළුවන.

## 2. අපි අනුග්‍රහය කරණකොටගෙන ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබ සිටිමු.

**"එබැවින් ඔව්හු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන මිදීම කරණකොටගෙන නොමිලයේ ධර්මිෂ්ඨකරනු ලබන්නෝ වෙති" (රෝම 3:24).**

ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම අළුත් ගිවිසුමෙහි ඉගැන්වෙන ඉතා අනර්ඝතම ඉගැන්වීමයි. ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබීම නම් කවදාවත් පව් නොකළ කෙනෙකු හැටියට දෙවියන්වහන්සේ විසින් අප පිලිගනු ලැබීමයි. මෙය උන්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන සිදුවෙන දෙයකි. අපි පව් කොට වැඩ වරද්දගත්තාවූ, වර්තාව නරක් කරගත්තාවූ මිනිසුන් වෙමු. එහෙත් නිකම්ම පාපවලට කමාව පමණක් නොදී කවදාවත් පව් නොකළ අය හැටියට අපගේ පසුගිය වාර්තාව පිරිසිදු කර අප පිළිගැනීමට දෙවියන්වහන්සේ කැමති වූයේ උන්වහන්සේගේම කරුණා අනුග්‍රහය නිසා මිස අපගේ මොන හොඳ කමක් නිසාද?

**"උන්වහන්සේගේ කරුණාවෙන්** (අනුග්‍රහයෙන්) **අප ධර්මිෂ්ඨකරනු ලැබ, සදාකල ජීවනයේ බලාපොරොත්තුවේ හැටියට උරුමක්කාරයන් වන පිණිස........" (තීතස් 3:6-7).**

## 3. අපි අනුග්‍රහය කරණකොටගෙන උපකාර ලබමුව.

**"එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්භවන පිණිසද නිසැක කමින් කරුණාවේ සිංහාසනයට ලඟා වෙමු. (හෙබ්‍රෙව් 4:16).**

දෙවියන්වහන්සේගේ කරුණාවේ සිංහාසනය වෙතින් අපට නියත ලෙසම ලැබෙනුයේ අපේ ඕනෑකම්වලදී අපට උපකාරයට ලැබෙන අනුග්‍රහයයි.

## 4. අපි අනුග්‍රහය කරණකොටගෙන මිදීම ලබන්නෙමු.

**"ඒ ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ උන්වහන්සේගේ කරුණාවේ (අනුග්‍රහයේ) සම්පතේ ප්‍රකාරයට උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපගේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය" (එපීස 1:7).**

දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ සම්පත ඉතා විශාල බැවින්, අපේ මිදීම වන අපේ වරදවලට කමාව ඉතා බහුල ලෙස අපට ලැබේ.

## 5. අපි අනුග්‍රහය මත පිහිටා සිටිමු.

**"අප පිහිටා සිටින මේ අනුග්‍රහයට උන්වහන්සේ කරණකොටගෙන ඇදහිල්ලෙන් ලඟා වී සිටිමුව" (රෝම 5:2).**

ඇදහිලිවතුන් ලෙස අප ලැබූ ගැළවීම තුල ස්ථිරව සිටීමට අපට හැකි වනුයේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නැමති පදනම මත ය. අපගේ මුළු ජීවිතය පුරාම දෙවියන්වහන්සේ විසින් අප පිළිගනු ලබන්නේ අපගේම යහපත් ගුණාංග නිසා නොව උන්වහන්සේගේ කරුණාව නිසා බව අපි දැනගත යුතු වෙමු. මෙය කෙතරම් සැනසිලිදයක සිතුවිල්ලක්ද? අපගේ පාපවලට කමාව දී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් අප සෝදා පවිත්‍රකොට, දේවදරුකම අපට ප්‍රදානය කිරීමෙන් අනතුරුවද උන්වහන්සේ අප සමඟ ආශ්‍රය කිරීම සඳහා පදනම් කර ගනුයේ උන්වහන්සේගේ කරුණාවන්තකම

මිස අපගේ යහපත් කල් ක්‍රියාවේ සමර්ථකම නොවේ. මෙය "අප පිහිටා සිටින අනුග්‍රහය" නම් වේ. එහෙත් මෙම අපූරු සත්‍යතාවය සුළු කොට සිතා දෙවියන්වහන්සේ විසින් තමන් පිලිගැනීම පිණිස නීති රීති පැවැත්වීම අවශ්‍යයැයි සිතූ ඇදහිලිවතුන් පිරිසක් පිළිබඳව අළුත් ගිවිසුමෙහි මෙසේ සඳහන් වේ. **"ව්‍යවස්ථාව කරණකොටගෙන ධර්මිෂ්ඨකරනු ලබන්නට සතුටු වූ නුඹලා ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කරනු ලද්දෙය. නුඹලා අනුග්‍රහයෙන් වැටී සිටින්නහුය" (ගලාති 5:4).** දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන ගැළවීම ලැබූ අපි එම අනුග්‍රහය මත පිහිටා සිටිමින් දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය ගෙන යා යුතු වෙමු.

## 6. අපි අනුග්‍රහයෙන් වර්ධනය විය යුතුවෙමු.

**"ස්වාමීවූ ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද** (අනුග්‍රහයෙහිද) **උන්වහන්සේ දැනගැනීමෙහිද වර්ධනය වෙයල්ලා" (2 පේත්‍රුස් 3:18).**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය තුළ වර්ධනය වීම යනු බහුලව පවතින උන්වහන්සේගේ අනුග්‍රහය වඩ වඩා අගය කිරීමටත්, භුක්තිවිඳීමටත් ඉගෙනගැනීමයි. උදහරණ ලෙස මවකගේ ප්‍රේමය ගැන සලකා බලන්න. මවකගේ ප්‍රේමය සැමවිටම බහුලව තිබේ. එහෙත් දරුවකු එම ප්‍රේමය අගය කරන ප්‍රමාණයේ වෙනස්කම් තිබේ. දෙමව්පියන්ගේ පරිත්‍යාගශීලි ක්‍රියා දරුවන් විසින් අගය කිරීමට පැමිණෙනුයේ ඔවුන් වැඩි වයසට පැමිණිවිටය. එහෙත් අප අඩු වයසේදීම අප දෙමව්පියන්ගේ පරිත්‍යාගශීලි ක්‍රියා අගය කරන්නට තරම් මේරූ අය වී නම් එය කෙතරම් අගනේද?

අපගේ අවශ්‍යතාවයට සරිලන පරිදි, ජීවිතයේ ඒ ඒ අවස්ථාවන්වලදී, දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අප උදෙසා බහුලව තිබේ. විවිධ ලෙඩරෝගී තත්වයන් දරා ගැනීම, වෙනත් දුක් කම්කටලුවලදී ඒවා ඉවසීම වැනි දෑ අපට පහසුකරවන්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයයි. වේදනාකාරී අත්දැකීම් තුළදී **"මාගේ කරුණාව** (කරුණා අනුග්‍රහය) **නුඹට සෑහේ"** යැයි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පාවුල් තුමාට පැවසුවේ මෙම සත්‍යතාවය නිසා ය (2 කොරින්ති 12:9). දෙවියන්වහන්සේගේ අනුග්‍රහය සෑම විටම අපට උවමනා කරන තරම් තිබේ. එහෙත් අවශ්‍ය කැරෙනුයේ එම අනුග්‍රහය අගය කිරීමෙහි ල

වර්ධනය වීමයි.

## 7. අපි අනුග්‍රහය තදින් අල්ලාගෙන සිටිමු.

**"එහෙයින් සොලවන්නට බැරි රාජ්‍යයක් ලබන්නාවූ අපි, ගෞරවයෙන්ද දේවභක්තියෙන්ද දෙවියන්වහන්සේට ප්‍රසන්නවන ලෙස සේවය කරන පිණිස <u>අනුග්‍රහය ඇතුව සිටිමු</u>** (අනුග්‍රහය තදින් අල්ලාගෙන සිටිමු)" **(හෙබ්‍රෙව් 12:28).**

"දෙවියන්වහන්සේට ප්‍රසන්න වන ලෙස සේවය කිරීම" සියලු ඇදහිලිවතුන් හට තිබෙන අභියෝගය යි. ඇතමුන් දෙවියන්වහන්සේට සේවය කරන්නේ, ඒ සඳහා උන්වහන්සේගෙන් කිසිම උපකාරයක් නොලැබෙන බවක් ලෝකයාට පෙන්වමිනි. ඒ වාගේම තමා කරන මේ සේවය "මහා ලොකු වැඩක්" යැයි පෙන්වන්නට ඔව්හු උත්සාහ දරති. ශුභාරංචි පොත්වල සඳහන්වන එරිසිවරයා අනුග්‍රහය තදින් අල්ලාගෙන දෙවියන්වහන්සේට සේවය කළ කෙනෙකු නොවේ. ඔහු තම උත්සාහයෙන්ම සේවය කිරීමට උත්සාහකොට අසාර්ථක වීම හේතුවෙන් වංචාකාරී ව පුහු මවා පෑමකට ඇබ්බැහි වූ බව පෙනේ. ඔවුන් මවා පෑවේ දෙවියන්වහන්සේට සේවය කිරීම ඔවුන්ට පමණක් කළහැකි මහා අමාරු කාර්යයක් ලෙසට ය. එහෙත් දෙවියන්වහන්සේගේ කැඳවීම නම් ඇදහිලිවන්ත අප සැමදෙන උන්වහන්සේගේ අනුග්‍රහය තුල ජීවත්වෙමින් සහ හැසිරෙමින් සේවය කිරීමය. දෙවියන්වහන්සේට බොහෝ සේ සේවය කළාවූ පාවුල්තුමා මේ පිළිබඳව පැවසූ වචන මේ සත්‍යතාවය මනාව පැහැදිලි කරයි. **"මම යම් ස්වභාවයකට පැමිණ සිටිම්ද එසේ සිටින්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් ය. උන්වහන්සේ මට දුන් අනුග්‍රහය නිශ්ඵල නොවී ය. මම ඔවුන් සියල්ලන්ට වඩා බොහෝසෙයින්ම වැඩ කෙලෙමි. නමුත් එසේ කළේ මා නොව මා කෙරෙහි තිබුනාවූ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය**

ය" (1 කොරින්ති 15:10).

# නැතිවම බැරි දෙවියන්වහන්සේගේ අනුග්‍රහය

දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ විවිධ ප්‍රයෝජන පිළිබඳ ඉහත සඳහන් වූ බයිබල් පද කියැවීමෙන් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මිනිසාගේ සදාකාලික ගැළවීම සඳහා අත්‍යවශ්‍ය බව මැනවින් සනාථ වේ. එහෙත් අවශ්‍ය වනුයේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මඳ වශයෙන් අපගේ ජීවිතයේ ක්‍රියාත්මක වීම නොව ඉතා බහුලත්වයෙන් යුතුව දේව අනුග්‍රහය අප තුල ක්‍රියාත්මක වීමයි. මේ සත්‍යතාවය සනාථ කිරීම සඳහා ශුද්ධ බයිබලයෙහි විවිධ ස්ථානවල අනුග්‍රහය යන වචනය සමඟ යොදා ඇති විශේෂණ පද සළකා බලන්න. අප අනුග්‍රහය අත්දැකිය යුත්තේ මෙවැනි බහුලත්ව ආකාරයටයි.

## 1. අනුග්‍රහයේ ඉතා මහත් සම්පත

**"එසේ කළේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ අප කෙරෙහි ඇත්තාවූ කරුණාවන්තකම නිසා තමන්වහන්සේගේ අනුග්‍රහයේ ඉතා මහත් සම්පත පැමිණෙන්නාවූ කාලවලදී පෙන්වන පිණිසය" (එපීස 2:7).**
**"ඒ ප්‍රේමවන්තයාණන් තුළ, උන්වහන්සේගේ කරුණාවේ**(අනුග්‍රහයේ) **සම්පතේ ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපගේ වරදවලට කමාව අපට ඇත්තේය" (එපීස 1:7).**

## 2. මහත් අනුග්‍රහය

**"ස්වාමීවූ යේසුස්වහන්සේගේ නැවත නැගීටීම ගැන ප්‍රේරිතයෝ මහත් බලයෙන් සාක්ෂි දුන්නෝය. මහත් අනුග්‍රහය ඔවුන් සියල්ලන් කෙරෙහි තිබුනේය" (ක්‍රියා 4:33).**

මෙම පදයේ සඳහන් වන මුල්ම ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යාන්තම් රස බැලුවා නොව මහත් බහුලත්වයෙන් දෙවියන්වහන්සේගේ

අනුග්‍රහය භුක්තිවින්දේ වූහ.

## 3. සෑහෙන අනුග්‍රහය

**"ඒක මා කෙරෙන් පහවන පිණිස ඒ ගැන තුන්වරක් ස්වාමින්වහන්සේගෙන් ඉල්ලුවෙමි. උන්වහන්සේද .... මාගේ කරුණාව (අනුග්‍රහය) නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයැ යි මට කී සේක" (2 කොරින්ති 12:8,9).**

අපගේ ජීවිතයේ අපට මුහුණ දීමට ඇති ඕනෑම කටුක අත්දැකීමකදී පරාජිත නොවී, මානසිකව නොවැටී වේදනා දරාගැනීමේ හැකියාව සඳහා දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අපට අවශ්‍ය ප්‍රමාණයට ලැබේ. ඉහත දේව වචන කොටසෙහි "සෑහේ" යන වචනයේ තේරුම "ඇති තරම් ප්‍රමාණවත් ලෙස" යන්නයි.

## 4. බහුල අනුග්‍රහය

**"එක්කෙනාගේ වරද නිසා ඒ එක්කෙනා කරණකොටගෙන මරණය රජකම් කළේ වී නම්, කරුණාවේද ධර්මිෂ්ඨකම නැමති දීමනාවේද බහුලත්වය ලබන අය, එක්කෙනා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඊට වඩා ජීවනයෙහි රජකම් කරන්නේය" (රෝම 5:17).**

අප ජීවනයෙහි රජකම් කරවීම සඳහා, එනම් පාපයට ඉහළින් ජයග්‍රාහී ජීවිතයක් ගෙන යෑම සඳහා, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බහුල කරුණා අනුග්‍රහය අප පිට වගුරුවන සේක.
**"පාපය බොහෝ වූ තැන අනුග්‍රහය ඊට වඩා අධික වූයේය" (රෝම 5:20).**

## 5. සියලු අනුග්‍රහය

**"තවද නුඹලා සියලු දේවලදී නිතරම පූර්ණකම ලැබ සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව සිටින පිණිස නුඹලාට සියලු අනුග්‍රහය වැඩි කර දෙන්නට දෙවියන්වහන්සේට පුළුවන" (2 කොරින්ති 9:8).**

ඉතා දිළිඳුව සිටි ඇදහිලිවතුන් තම දිළිඳුකම මැද්දේ පරිත්‍යාගශීලීව

ක්‍රියා කිරීමට ඉදිරිපත් වීමේ රහස දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ඔවුන් තුළ ක්‍රියා කිරීම බව 2 කොරින්ති 8 සහ 9 පරිච්ඡේදවල පාවුල් තුමා පැහැදිලිකර දෙයි. ඔවුන්ට තිබූ සියළු අවශ්‍යතාවන් සඳහා සරිලන සියලු අනුග්‍රහය ඔවුන්ට ලැබුණි.

## 6. අනේකාකාර අනුග්‍රහය

**"දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ (අනුග්‍රහයේ) යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා" (1 පේතෘස් 4:10).**

ගබඩාකරුවෙකුගේ අත යටතෙහි තිබෙන්නේ අයිතිකරුවෙකු විසින් ප්‍රවේශමට තැබූ බඩු බාහිරාදියයි. අපි දෙවියන්වහන්සේගේ අනේකාකාර අනුග්‍රහයේ ගබඩාකාරයන් වී සිටිමු. එනම් ඒ ඒ අවස්ථාවටත්, ඒ ඒ අවශ්‍යතාවයටත්, ඒ ඒ සේවයටත් සරිලන පරිදි දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණා අනුග්‍රහය අප වෙත ලබා දී තිබේ. විශ්වාසවන්ත ගබඩාකරුවන් හැටියට දෙවියන්වහන්සේගෙන් ලැබූ ඒ අනේකාකාර අනුග්‍රහය මගින් අපි දෙවියන්වහන්සේට සේවය කළ යුතු වෙමු. **"දෙවියන්වහන්සේ මට දුන් අනුග්‍රහය නිශ්ඵල නොවීය. මම ඔවුන් සියල්ලන්ට වඩා බොහෝ සයින් වැඩ කෙළෙමි. නමුත් එසේ කලේ මා නොව මා කෙරෙහි තිබුනාවූ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යි" (1 කොරින්ති 15:10).**

## 7. රජකම් කරන අනුග්‍රහය

**"පාපය මරණයෙහි රජකම් කලාක් මෙන්ම අනුග්‍රහය සදාකාල ජීවනය සඳහා, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුවහන්සේ කරණකොටගෙන, ධර්මිෂ්ඨකමෙන් රජකම් කරන පිණිස පාපය බොහෝ වූ තැන අනුග්‍රහය ඊට වඩා අධික වූයේය" (රෝම 5:20).**

ඇදහිලිවන්ත අපගේ ජීවිතවල රජකම් කරන ප්‍රධාන සාධකය දෙවියන්වහන්සේගේ අනුග්‍රහය විය යුතුමය. නීති ව්‍යවස්ථාව තව දුරටත් අප කෙරෙහි රජකම් කරන්නේ නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල දෙවියන්වහන්සේගේ අභිප්‍රායට අප තවම ඇතුලත් වී නැත. අද අපගේ

ජීවිත පාලනය විය යුත්තේ දෙවියන්වහන්සේගේ නීති ව්‍යවස්ථාව මගින් නොව අප ජීවිතයෙහි රජකම් කරන දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මගිනි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පාපවලට කමාව තිබෙන නිසා ව්‍යවස්ථාවට අප ජීවිත කෙරෙහි තිබූ බලය ගිලිහී ගොස් ඇත. ඒ වෙනුවට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අප ජීවිත කෙරෙහි රජකම් කරයි. අද දෙවියන්වහන්සේ තමන්ගේ ප්‍රසාදය අප වෙත දක්වන්නේ තමන්වහන්සේගේ නීති රීති අප විසින් පැවැත්වීම නිසා නොව උන්වහන්සේගේම කරුණා අනුග්‍රහය හේතුකොටගෙනය.

දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය ගැන ස්වාමීවූ යේසුස්වහන්සේ